GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012.07.19

## මාධ්‍ය නිවේදනයයි

## ලංකාව තුල සුදුසුකම් නොලත් විදේශීය වෛද්‍යවරුන් සේවය කිරීම පිළිබඳ ගැටළුව

ලංකාවට පැමිණෙන විදේශ වෛද්‍යවරු වෛද්‍ය ආඥාපනතේ 67A වගන්තිය යටතේ වෛද්‍යවරු ලෙස "තාවකාලික ලියාපදිංචිය ලබා ගනී." ඉන් අනතුරුව ඔවුන් විශේෂඥ වෛද්‍යවරු ලෙස ලංකාවේ සේවය කරයි.

67A වගන්තිය යටතේ ලියාපදිංචිය ලබාදීමේදී ඔවුන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීමේ පිලිගත් ක්‍රමවේදයක් මේ වන තෙක් නොතිබුණි. එබැවින් සුදුසුකම් නොමැතිව මොවුන් රෝගී ප්‍රතිකාර සිදු කරණ බව අපට දැනගන්නට ලැබී ඇත.

මේ පිළිබඳ අප සෞඛ්‍ය ලේකම් තුමාට දැනුම් දුන් අතර ඒ අනුව වෛද්‍ය සුදුසුකම් පරික්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට තිරණය විය. ඒ අනුව පිලිගත් ක්‍රමවේදයක් මේ වන විට එළි දක්වා ඇත.

එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මඟින් සුදුසුකම් නොමැතිව සේවය කළ විදේශ වෛද්‍යවරුන් කිහිප දෙනෙකුගේ සේවය අත්හිටුවීමට අදාල බලධාරින් කටයුතු කර ඇත.

මෙසේ සුදුසුකම් නොමැති බවට තහවුරු වූ වෛද්‍යවරුන් කිහිප දෙනෙකුට විවිධ මට්ටමේ දේශපාලන හා අනෙකුත් බලපෑම් මත අදාල අනුමැතිය ලබා දීමට සෞඛ්‍ය බලධාරින් කටයුතු සිදු කරන බව අපට දැන ගන්නට ලැබී ඇත.

මෙවැනි අඩු සුදුසුකම් වෛද්‍යවරු විශේෂඥ වෛද්‍යවරුන් ලෙස සේවය කිරීම රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීමට රජයක් ලෙස ගන්නා උත්සාහයට බාදා සිදුකිරීමක් ලෙස පෙනී යයි.

මෙසේ පිලිගත් ක්‍රම වේදයක් තිබියදී ඉන් බාහිරව වෙනත් බලපෑම් මත සුදුසුකම් රහිත විදේශ වෛද්‍යවරුන් විශේෂඥ වෛද්‍යවරුන් ලෙස සේවයේ යෙදීමට අවසර දීමත් ඒ තුලින් රටේ ජනතාවගේ සෞඛ්‍යය බරපතල අවධානමකට හෙලීමත් අප සංගමයේ දැඩි අවධානයට ලක්ව ඇත.

මේ පිලිබඳව අප සංගමය සියළුම විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා ඊට අනුබද්ධ සියළුම ආයතන වල සාමාජිකයින් සමග තිරණාත්මක සාකච්ඡාවක් මෙම සෙනසුරාදා 2012/07/21 දින ශ්‍රී ලංකා වෛද්‍ය සංගම් මුලස්ථානයේදී පැවැත්වේ. මෙහිදී සුදුසුකම් රහිත විදේශීය විශේෂඥ වෛද්‍යවරුන් සම්බන්ධයෙන් ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග තිරණය වනු ඇත.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

වැඩිදුර විස්තර :

වෛද්‍ය නවීන් සොයිසා : 0718582444
වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942